# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

| 11 ශ්‍රේණිය | නර්තනය | 2.1 ඒකකය |
|---|---|---|

කාලය : පැය 1

### 1 සිට 12 දක්වා ගොඩ සරඹ ප්‍රදර්ශනය කරමු.

- **නිවැරදි පිළිතුර තෝරන්න.**

01. ගොඩ සරඹ 12 සඳහා පද,
    (1). 2ක් භාවිතා කෙරේ. (3). 6ක් භාවිතා කෙරේ.
    (2). 12ක් භාවිතා කෙරේ. (4). 1ක් භාවිතා කෙරේ.

02. ගොඩ සරඹ නර්තනයේදී වැඩි වශයෙන්,
    (1). සාත්වික අභිනය ප්‍රයෝජනයට ගනී. (3). ආංගික අභිනය ප්‍රයෝජනයට ගනී.
    (2). වාචික අභිනය ප්‍රයෝජනයට ගනී. (4). ආහාර්ය අභිනය ප්‍රයෝජනයට ගනී.

03. සෑම ගොඩ සරඹයකටම,
    (1). අඩව්වක් ඇත. (3). වට්ටම් පදයක් ඇත.
    (2). කස්තිරමක් ඇත. (4). සීරුමාරුවක් ඇත.

04. ගොඩ සරඹ නර්තනය කරන්නේ,
    (1). මැදුම් තනි තිතටය (3). සුලු මැදුම් දෙතිතටය
    (2). සුලු තනි තිතටය (4). මහ තනි තිතටය

05. ගොඩ සරඹ නර්තනයේ දී කස්තිරම් නටන්නේ,
    (1). සම ගුණයට (2). දෘතලයට (3). මධ්‍යලයට (4). අති දෘතලයට

(ලකුණු 2 × 5 = 10)

- **හිස්තැනට නිවැරදි පිළිතුර තෝරන්න.**

01. පා සරඹ හා ගොඩ සරඹ වශයෙන් උඩරට නර්තන සම්ප්‍රදායේ සරඹ වර්ග ....................................... කි.
02. 12 වන ගොඩ සරඹයේ සරඹ නාමය ............................................ හරඹය යනුවෙන් සඳහන් වේ.
03. සුරල් ඇතුළත් කස්තිරම් ආරම්භවන්නේ උඩරට ............................................. වන ගොඩ සරඹයත් සමගය.
04. අර්ධ චක්‍ර හරඹය යනු ............................................. වන ගොඩ සරඹය යි.
05. ............................................. ආශ්‍රයෙන් අලංකාර මාත්‍රා නිර්මාණය කර ගැනේ. (ලකුණු 2 × 5 = 10)

- **කෙටි පිළිතුරු සපයන්න.**

01. 11 වන ගොඩ සරඹයේ සරඹ නාමය සහ පදය ලියා දක්වන්න.
02. 12 වන ගොඩ සරඹයට අයත් කස්තිරම ලියා දක්වන්න.
03. ගොඩ සරඹ නර්තනයේදී දෙපසට තිරස්ව චලනය සිදු කෙරෙන සරඹ නාම දෙකක් සඳහන් කරන්න.
04. උඩරට සම්ප්‍රදායේ ගොඩ සරඹ මෙන් පහතරට හා සබරගමු සම්ප්‍රදායන්හි නර්තනය කරනු ලබන පද හඳුන්වන නම් මොනවාද?
05. ගොඩ සරඹ නර්තනයෙන් ආධුනිකයාට ලැබෙන ප්‍රයෝජන 3ක් සඳහන් කරන්න.

(ලකුණු 6 × 5 = 30)

*සැකසුම : අමිලා ජීවනී*